JMC vLearning

"your virtual learning partner"

# ආර්ථික විද්‍යාව - ECN 103

**Prepared by - Chinthaka Kelum Udayasiri**

**Visiting Lecturer (University of Colombo)**

**BBA (SP) Mgt (University of Colombo)**

**Gold Medalist (University of Colombo)**

**CIM (UK) Passed Finalist**

**AAT Passed Finalist**

# විෂය අන්තර්ගතය හා බර තැබීම

- ව්‍යාපාර පරිසරයට අදාළ ආර්ථික සංකල්ප හා ආර්ථික පද්ධති - 15%
- ඉල්ලුම, සැපයුම, සමතුලිතය හා රජය මැදිහත්වන ආකාරය - 20%
- නිෂ්පාදන ක්‍රියාවලියේ හැසිරීම සහ විවිධ වෙළඳපොළ ව්‍යුහයන් - 15 %
- ජාතික ගිණුම්කරණය හා රජයේ කාර්යභාරය - 20%
- මූල්‍ය පද්ධතිය, මුදල් හා සාමාන්‍ය මිල මට්ටම - 15%
- අන්තර්ජාතික වෙළඳාම හා විදේශ විනිමය වෙළඳපොළ - 10%
- ආර්ථික වර්ධනය, සංවර්ධනය හා ආර්ථිකයේ නව ප්‍රවණතා - 5%

©JMC vLearning

# ජාතික ආදායම් ගිණුම්කරණය

## ➢ ජාතික නිෂ්පාදිතය

**ආර්ථිකයක යම් කාල පරිච්ඡේදයක් තුල නිපදවන ලද භාණ්ඩ හා සේවා වල අගය ජාතික නිෂ්පාදිතය ලෙස සැළකේ.**

එනම්, යයි යම් කාලපරිච්ඡේදයක් තුළ දේශීය ආර්ථිකයේ සියලුම ආයතනික ඒකකයන්ගේ කාර්ය සාධනය, ආර්ථික හැසිරීම හා එහි ව්‍යුහයත්, ආර්ථික ප්‍රවාහයන්ගේ වටිනාකමත් ඇස්තමේන්තු කිරීම ජාතික ගිණුම් සැකසීම ලෙස හැඳින්වේ.

JMC vLearning "your virtual learning partner"

©JMC vLearning

# ජාතික ආදායම් ගිණුම්කරණය

## ➢නිෂ්පාදනය

ශ්‍රමය, ප්‍රාග්ධනය සහ අමුද්‍රව්‍ය යෙදවුම් වශයෙන් භාවිත කරමින් කිසියම් ආයතනික ඒකකයක පාලනයට යටත්ව භාණ්ඩ හා සේවා නිමවුම් වශයෙන් බිහි කෙරෙන ක්‍රියාකාරකමක් ආර්ථික නිෂ්පාදනයක් වශයෙන් නිර්වචනය කෙරේ.

JMC vLearning "your virtual learning partner"

# ජාතික ආදායම් ගිණුම්කරණය

## ➢ නිෂ්පාදන ඉම

ජාතික ගිණුම්කරණයේදී ආර්ථික නිෂ්පාදන ක්‍රියාකාරකමක් හෙවත් ඵලදායී නිෂ්පාදන කටයුතු ලෙස සැලකෙන්නේ කවර ඒවාද යන්න හඳුනා ගැනීම හෙවත් ආර්ථික නිෂ්පාදන ක්‍රියාකාරකම් සහ ආර්ථික නොවන නිෂ්පාදන ක්‍රියාකාරකම් වෙන්කොට හඳුනා ගැනීම නිෂ්පාදන ඉම ලෙස සැලකේ.

"JMC vLearning "your virtual learning partner"

©JMC vLearning

# දළ දේශීය නිෂ්පාදිතයට ඇතුලත් කරනු ලබන ඵලදායී ආර්ථික කටයුතු

- නිෂ්පාදනය කළ සියලුම භාණ්ඩ හා සේවා
- තමන්ගේ නිවසින් ලබා දෙන්නා වූ නේවාසික සේවය
- වැටුප් හෝ එවැනි වෙනත් ආකාරයේ ගෙවීමක් වෙනුවෙන් වැය කළ ශ්‍රමය
- තම පෞද්ගලික පරිභෝජනය සඳහා නිෂ්පාදනය කළ භාණ්ඩ
- ස්වේච්ඡා ශ්‍රමය භාවිතයෙන් නිෂ්පාදනය කළ භාණ්ඩ හා සේවා

©JMC vLearning

# දළ දේශීය නිෂ්පාදිතයට ඇතුලත් කරනු නොලබන ඵලදායී ආර්ථික කටයුතු

- ඉගෙනීම හා විවේකය
- නොමිලේ ලැබෙන ස්වභාවික සම්පත් (භූමිය, ජලය, වාතය)
- ගෙවීමකින් තොරව නිවාස තුළ ඉටු කරනු ලබන ගෘහ සේවය
- මිනිස් ශ්‍රමයකින් තොරව වර්ධනය වන ස්වභාවික සම්පත් (වනාන්තර)
- මිල වෙනස් වීම හෝ ස්වභාවික වර්ධනය මගින් සම්පත් වල සිදුවන වටිනාකම වෙනස් වීම

©JMC vLearning

# දළ දේශීය නිෂ්පාදිතයට ඇතුලත් කරනු නොලබන ඵලදායී නොවන ක්‍රියා

- සංක්‍රාම ගනුදෙනු
- මූල්‍ය පත්‍රිකා ආශ්‍රිත ගනුදෙනු
- පාවිච්චි කළ භාණ්ඩ විකිණීම ආශ්‍රිත ගනුදෙනු

JMC vLearning
"your virtual learning partner
©JMC vLearning

# නිරීක්ෂණය නොකෙරෙන ආර්ථිකය

සැඟවුණු ආර්ථික ක්‍රියා

නිත්‍යානුකූල නොවන ආර්ථික ක්‍රියා

©JMC vLearning

# ජාතික ගිණුම් සැකසීමේ වැදගත්කම

- ආර්ථිකයේ කාර්යසාධනය ඇගයිය හැකි වීම
- ජාත්‍යන්තර සැසඳීම් සඳහා උපකාරී වීම
- ආර්ථික වෘද්ධිය මැනිය හැකි වීම
- ආර්ථිකයේ ව්‍යුහමය ලක්ෂණ අනාවරණය කළ හැකි වීම
- ඒක පුද්ගල ජාතික නිෂ්පාදිතය ඇස්තමේන්තු කළ හැකි වීම
- සම්පත් සංයුතිය හා උපයෝජනය අනාවරණය වීම
- සාර්ව ආර්ථික විචල්‍යයන්ගේ හැසිරීම පුරෝකථනය කිරීම
- ආර්ථික කාරක අතර ශ්‍රිතාත්මක සම්බන්ධතා හඳුනා ගැනීම

JMC vLearning your virtual learning partner

©JMC vLearning

# ජාතික ගිණුම් දත්ත වල පවත්නා සීමා

- නොවිධිමත් ආර්ථිකය තුළ සිදුවන ඵලදායී නිෂ්පාදන ඇතුළත් නොවීම
- යැපුම් ආර්ථික කටයුතු ජාතික නිෂ්පාදිතයට ඇතුළත් නොවීම
- ගෘහනියන්ගේ සේවය ජාතික නිෂ්පාදිතයට ඇතුළත් නොවීම
- රාජ්‍ය ණය පොළී ජාතික නිෂ්පාදිතය ගණනය කිරීමට දායක කර නොගැනීම
- නිෂ්පාදනය නිසා පරිසරයට සිදුවන හානිය සැලකිල්ලට නොගැනීම
- රාජ්‍ය සේවාවල ඵලදායීතාවේ ඇති වන වෙනස් වීම සලකා නොලැබීම
- යුද හා ආරක්ෂණ කටයුතු සඳහා දරන වියදම් ඵලදායි නිෂ්පාදනයක් ලෙස සැලකීම

©JMC vLearning

# ජාතික ගිණුම්කරණයට ඇති විවිධ ප්‍රවේශ

- නිෂ්පාදන ප්‍රවේශය
- ආදායම් ප්‍රවේශය
- වියදම් ප්‍රවේශය

JMC vLearning
"your virtual learning partner"

©JMC vLearning

# ආණ්ඩුවේ අසමත්වීම්

ආණ්ඩුවේ අසමත්වීම් යනු වෙළඳපොළ අසාර්ථක වීම වළක්වා ගැනීම සඳහා රජය විසින් ආර්ථිකය සඳහා කරනු ලබන මැදිහත්වීම් රාජ්‍ය අංශයට අවේණික වූ ඇතැම් දුර්වලතා කරණකොටගෙන අපේක්ෂිත ප්‍රතිඵල ලබා නොදී ආර්ථිකයේ තවත් අකාර්යක්ෂමතා බිහි කිරීම යි.

©JMC vLearning

# ආණ්ඩුවේ අසමත්වීම්

**ආණ්ඩුවේ අසමත්වීම් සඳහා බලපාන හේතු**

- දේශපාලන ස්වාර්ථය
- පරිපාලන වියදම් ඉහළ යාම
- ආණ්ඩුවේ ක්‍රියාකාරීත්වයේ දක්නට ඇති දෘඪ තාවයන්න්
- ඇතැම් පුද්ගලයන් හා ආයතන රජය විසින් ක්‍රියාත්මක කරන නීති රීති හා නියාමනයන්ගෙන් සැඟවී සිටීම

©JMC vLearning

# වෙළඳපොළ ආර්ථිකයක රජයේ කාර්යභාරය

- සම්පත් කාර්යක්ෂමව බෙදා හැරීම
- ආදායම් හා ධනය සාධාරණව බෙදා හැරීම
- සාර්ව ආර්ථික ස්ථායීතාව ඇති කිරීම
- තිරසාර සංවර්ධනය

JMC vLearning "your virtual learning partner"

# ෆිස්කල් ප්‍රතිපත්තිය

❖ සාර්ව ආර්ථික අරමුණු ළඟා කරගැනීම උදෙසා රාජ්‍ය වියදම්, බදු අය කිරීම් සහ ණය ගැනීම් සම්බන්ධව ගනු ලබන ක්‍රියාමාර්ග සහ සිදු කරන වෙනස්කම් රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය ලෙස හැඳින්වේ

JMC vLearning "your virtual learning partner"

©JMC vLearning

# ෆිස්කල් ප්‍රතිපත්තිය

- සංකෝචනාත්මක රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය
- ප්‍රසාරණාත්මක රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය
- මධ්‍යස්ථ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය

©JMC vLearning

# ෆිස්කල් ප්‍රතිපත්තිය

- රාජ්‍ය වියදම




©JMC vLearning

# ෆිස්කල් ප්‍රතිපත්තිය

- රාජ්‍ය ආදායම




©JMC vLearning

# රජයේ අය වැය, ඍජු බදු හා වක්‍ර බදු

- අයවැය හිඟය
- අයවැය අතිරික්තය
- තුලිත අයවැය

©JMC vLearning

# ෆිස්කල් ප්‍රතිපත්තිය

- රාජ්‍ය ණය වල ආර්ථික ප්‍රතිවිපාක




©JMC vLearning

# ෆිස්කල් ප්‍රතිපත්තිය

- විසර්ජන කෙටුම්පත
- පරිපූරක ඇස්තමේන්තුව
- අතුරු සම්මත ගිණුම

JMC vLearning "your virtual learning partner"

©JMC vLearning


# රාජ්‍ය අයවැය පරීක්ෂා කිරීමට යොදා ගන්නා මිනුම්

- වර්තන ගිණුමේ ශේෂය
- ප්‍රාථමික ගිණුමේ ශේෂය
- ශුද්ධ මූල්‍ය හිඟය

©JMC vLearning

# ෆිස්කල් ප්‍රතිපත්තිය

- බදු වර්ග




©JMC vLearning

# සාර්ව ආර්ථික අරමුණු

- පූර්ණ සේවා නියුක්තිය
- ආදායම් බෙදීයාමේ සාධාරණත්වය
- ගෙවුම් ශේෂ සමතුලිතතාව
- මිල ස්ථායිතාවය
- තිරසාර සංවර්ධනය

©JMC vLearning

# පසුගිය විභාග ප්‍රශ්න

**1.3** පහත සඳහන් ඒවා අතුරෙන්, රජය විසින් දරණ ලද ප්‍රාග්ධන වියදමකට උදාහරණයක් වන්නේ කුමක් ද?

(1) ණය සඳහා පොලී ගෙවීම්.
(2) පුනරාවර්තන මාරුකිරීම්.
(3) මූර්ත වත්කම් මිලදී ගැනීම.
(4) සහනාධාර සැපයීම.

**1.19** ජාතික ආදායම් ගිණුම්වල සීමා (limitations) දෙකක්(02) සඳහන් කරන්න.

**1.20** සාර්ව ආර්ථික අරමුණු (macroeconomic objectives) දෙකක්(02) සඳහන් කරන්න.

(B) ජාතික ආදායම් ගිණුම් පිළියෙල කිරීමේ වැදගත්කම සඳහා දැක්විය හැකි හේතු තුනක්(03) **ලැයිස්තුගත කරන්න.**
(ලකුණු 03)

JMC vLearning
"your virtual learning partner"
©JMC vLearning

# පසුගිය විභාග ප්‍රශ්න

(C) වර්ෂයක කාලපරිච්ඡේදයක් සඳහා ආර්ථිකයක ජාතික ගිණුම්වලට අදාල පහත සඳහන් කල්පිත දත්ත (hypothetical data) ඔබට ලබා දෙනු ඇත:

| | රු. මිලියන |
|---|---|
| පෞද්ගලික පරිභෝජන වියදම් | 2,000 |
| රජයේ පරිභෝජන වියදම් | 1,500 |
| දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය | 1,200 |
| අපනයන | 1,800 |
| ආනයන | 1,250 |
| විදේශ ශුද්ධ සාධක ආදායම (විදේශීය ශුද්ධ ප්‍රාථමික ආදායම) | - 800 |

**ඔබ විසින් කළ යුතු දෑ:**

වියදම් ප්‍රවේශය (expenditure approach) භාවිත කරමින්, පහත සඳහන් දෑ **ගණනය කරන්න**:

(a) වෙළෙඳපොළ මිලට දළ දේශීය වියදම [Gross Domestic Expenditure (GDE)]. (ලකුණු 04)

(b) වෙළෙඳපොළ මිලට දළ දේශීය නිෂ්පාදිතය [Gross Domestic Product (GDP)]. (ලකුණු 03)

(c) වෙළෙඳපොළ මිලට දළ ජාතික ආදායම [Gross National Income (GNI)]. (ලකුණු 03)

(මුළු ලකුණු 20)

JMC vLearning "your virtual learning partner"

# පසුගිය විභාග ප්‍රශ්න

(A) වසරක කාලයක් සඳහා ආර්ථිකයක ජාතික ගිණුම්වලට අදාළ පහත සඳහන් උපකල්පිත දත්ත ඔබ වෙත සපයා ඇත:

| | රු. මිලියන |
|---|---|
| පෞද්ගලික පරිභෝජන වියදම් | 600 |
| රජයේ පරිභෝජන වියදම් | 500 |
| දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය | 400 |
| තොග වෙනස්වීම් | 200 |
| අපනයන | 400 |
| ආනයන | 250 |
| විදේශ ශුද්ධ සාධක ආදායම (විදේශීය ශුද්ධ ප්‍රාථමික ආදායම) | -100 |

**ඔබ විසින් කළ යුතු දෑ:**

වියදම් ප්‍රවේශය (expenditure approach) භාවිත කරමින්, පහත සඳහන් දෑ **ගණනය කරන්න**:

(a) වෙළෙඳපොළ මිලට දළ දේශීය වියදම [Gross Domestic Expenditure (GDE)]. (ලකුණු 05)

(b) වෙළෙඳපොළ මිලට දළ දේශීය නිෂ්පාදිතය [Gross Domestic Product (GDP)]. (ලකුණු 03)

(c) වෙළෙඳපොළ මිලට දළ ජාතික ආදායම [Gross National Income (GNI)]. (ලකුණු 02)

©JMC vLearning

# පසුගිය විභාග ප්‍රශ්න

(B) (a) රජයේ පිස්කල් ප්‍රතිපත්තිය (Fiscal Policy) සහ මූල්‍ය ප්‍රතිපත්තිය (Monetary Policy) අතර වෙනස **පැහැදිලි කරන්න**. (ලකුණු 04)

(b) අයවැය හිඟය (budget deficit) යනුවෙන් අදහස් කරන්නේ කුමක්දැයි **පැහැදිලි කරන්න**. (ලකුණු 02)

(C) (a) වෙළෙඳපොළ ආර්ථිකයක් තුළ සම්පත් බෙදී යාමේ අකාර්යක්ෂමතාවයන් වැළැක්වීම (inefficiencies of resource allocation) සඳහා රජය විසින් ගනු ලබන ක්‍රියාමාර්ග (measures) දෙකක්(02) **සඳහන් කරන්න**. (ලකුණු 02)

(b) රජයේ අසමත්වීම (failure of the government) කෙරෙහි බලපාන හේතු දෙකක්(02) **සඳහන් කරන්න**. (ලකුණු 02)

©JMC vLearning

# පසුගිය විභාග ප්‍රශ්න

(B) (a) වසරක කාලයක් සඳහා ආර්ථිකයක ජාතික ගිණුම්වලට අදාළ පහත සඳහන් උපකල්පිත දත්ත ඔබ වෙත ලබාදී ඇත:

| | රු. මිලියන |
|---|---:|
| සේවක ආදායම | 7,500 |
| දළ මෙහෙයුම් අතිරික්තය | 13,600 |
| මිශ්‍ර ආදායම | 1,200 |
| නිෂ්පාදන සහනාධාර අඩුකළ පසු වෙනත් බදු | 150 |
| නිෂ්පාදන සහ ආනයන මත ශුද්ධ බදු | 2,000 |
| විදේශ ශුද්ධ ප්‍රාථමික ආදායම | (1,400) |

**ඔබ විසින් කළ යුතු දෑ:**

ආදායම් ප්‍රවේශය (Income approach) භාවිත කරමින්, පහත සඳහන් දෑ **ගණනය කරන්න**:

(i) මූලික මිල යටතේ දළ එකතු කළ අගය [Gross Value Added (GVA)]. (ලකුණු 05)

(ii) වෙළෙඳපොළ මිලට දළ දේශීය නිෂ්පාදිතය [Gross Domestic Product (GDP)]. (ලකුණු 02)

(iii) වෙළෙඳපොළ මිලට දළ ජාතික ආදායම [Gross National Income (GNI)]. (ලකුණු 02)

©JMC vLearning

JMC vLearning "your virtual learning partner"

# පසුගිය විභාග ප්‍රශ්න

(A) (a) රාජ්‍ය අයවැයෙහි ඇතුළත් පුනරාවර්තන (recurrent) වියදම් සහ ප්‍රාග්ධන (capital) වියදම් අතර ඇති වෙනස **පැහැදිලි කරන්න**. (ලකුණු 03)

(b) චක්‍ර බද්දක් යන්නෙන් අදහස් කරන්නේ කුමක්දැයි **පැහැදිලි කරන්න**. (ලකුණු 02)

(b) ජාතික ගිණුම් සැකසීමේ වැදගත්කම් හතරක්(04) **ලැයිස්තුගත කරන්න**. (ලකුණු 04)

(C) රාජ්‍ය "ෆිස්කල් (Fiscal) ප්‍රතිපත්තිය" යන පදය **පැහැදිලි කරන්න**. (ලකුණු 02)

(මුළු ලකුණු 20)

JMC vLearning "your virtual learning partner"

# පසුගිය විභාග ප්‍රශ්න

(A) වසරක කාලපරිච්ඡේදයක් සඳහා ආර්ථිකයක ජාතික ගිණුම්වලට අදාලව පහත සඳහන් උපකල්පිත දත්ත ඔබ වෙත ලබා දී ඇත:

| | රු. මිලියන |
|---|---|
| පෞද්ගලික පරිභෝජන වියදම | 7,500 |
| රජයේ පරිභෝජන වියදම | 2,400 |
| දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය | 800 |
| අපනයන | 1,300 |
| ආනයන | 2,000 |
| විදේශ ශුද්ධ සාධක ආදායම (විදේශ ශුද්ධ ප්‍රාථමික ආදායම) | (600) |

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) පහත සඳහන් දෑ **ගණනය කරන්න**:

(i) වෙළෙඳපොළ මිලට දළ දේශීය වියදම [Gross Domestic Expenditure (GDE)]. (ලකුණු 04)

(ii) වෙළෙඳපොළ මිලට දළ දේශීය නිෂ්පාදිතය [Gross Domestic Product (GDP)]. (ලකුණු 03)

(iii) වෙළෙඳපොළ මිලට දළ ජාතික ආදායම [Gross National Income (GNI)]. (ලකුණු 02)

©JMC vLearning

# පසුගිය විභාග ප්‍රශ්න

**1.20** ජාතික ආදායමේ චක්‍රාකාර ප්‍රවාහයේ ඇති කාන්දුවීම් (ගිලිහීම්) සඳහා උදාහරණ දෙකක්(02) සඳහන් කරන්න.

(b) ජාතික ගිණුම්වල පවත්නා සීමාවන් (limitations) දෙකක්(02) **ලැයිස්තුගත කරන්න**. (ලකුණු 02)

(B) රටකට සෘණ ආර්ථික වර්ධනයක් පැවතීමෙන් ඇතිවිය හැකි ප්‍රතිවිපාක තුනක්(03) **සඳහන් කරන්න**. (ලකුණු 03)

(C) සාර්ව ආර්ථික අරමුණු තුනක්(03) **පැහැදිලි කරන්න**. (ලකුණු 06)

(මුළු ලකුණු 20)

©JMC vLearning

# පසුගිය විභාග ප්‍රශ්න

(A) වසරක කාලපරිච්ඡේදයක් සඳහා ආර්ථිකයක ජාතික ගිණුම්වලට අදාළව පහත සඳහන් උපකල්පිත දත්ත ඔබ වෙත ලබා දී ඇත:

| | රු. මිලියන |
|---|---|
| සේවක ආදායම | 1,000 |
| දළ මෙහෙයුම් අතිරික්තය | 1,400 |
| මිශ්‍ර ආදායම් | 1,200 |
| නිෂ්පාදනය මත සහනාධාර අඩුකළ පසු වෙනත් බදු | 750 |
| විදේශීය ප්‍රාථමික ආදායම් ගෙවීම | 1,500 |
| විදේශීය ප්‍රාථමික ආදායම් ලැබීම් | 1,200 |
| නිෂ්පාදනය සහ ආනයන මත ශුද්ධ බදු | 500 |

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) ආදායම් ප්‍රවේශය (Income Approach) භාවිත කරමින්, පහත සඳහන් දෑ **ගණනය කරන්න**:

(i) මූලික මිලට දළ එකතු කළ අගය [Gross Value Added (GVA)]. (ලකුණු 05)

(ii) වෙළෙඳපොළ මිලට දළ දේශීය නිෂ්පාදිතය [Gross Domestic Product (GDP)]. (ලකුණු 02)

(iii) වෙළෙඳපොළ මිලට දළ ජාතික ආදායම [Gross National Income (GNI)]. (ලකුණු 03)

JMC vLearning "your virtual learning partner"

# පසුගිය විභාග ප්‍රශ්න

**1.10** ව්‍යාපාර චක්‍රයෙහි පතුලේ සිට මුදුණින දක්වා වන කාල පරාසය හඳුන්වනු ලබන්නේ:

(1) අවපාත අවධිය. (2) ප්‍රසාරණ අවධිය. (3) ආර්ථික පරතරය. (4) නිමැවුම් පරතරය.

(b) ජාතික ආදායම් ගිණුම්කරණයේ මූලික මිල යනුවෙන් අදහස් කරන්නේ කුමක්දැයි **පැහැදිලි කරන්න**.

(ලකුණු 02)

(B) රටක ආර්ථිකයක් කළමනාකරණය කිරීමේදී භාවිත කරනු ලබන ප්‍රතිපත්ති සහ උපායමාර්ග සාර්ව ආර්ථික ප්‍රතිපත්ති ලෙස සැලකේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

සාර්ව ආර්ථික ප්‍රතිපත්ති දෙකක්(02) **පැහැදිලි කරන්න**.

(ලකුණු 04)

JMC vLearning
"your virtual learning partner"
©JMC vLearning

# පසුගිය විභාග ප්‍රශ්න

(B) වසරක කාලයක් සඳහා ආර්ථිකයක ජාතික ගිණුම්වලට අදාල පහත සඳහන් උපකල්පිත දත්ත ඔබ වෙත සපයා ඇත:

| | රු. මිලියන |
|---|---|
| සේවක ආදායම | 4,200 |
| දළ මෙහෙයුම් අතිරික්තය | 3,600 |
| මිශ්‍ර ආදායම | 1,800 |
| නිෂ්පාදනය මත සහනාධාර අඩුකළ පසු වෙනත් බදු | 600 |
| විදේශ ශුද්ධ ප්‍රාථමික ආදායම | 300 |
| නිෂ්පාදනය සහ ආනයන මත ශුද්ධ බදු | 700 |

**ඔබ විසින් කළ යුතු දෑ:**

ආදායම් ප්‍රවේශය (Income approach) භාවිත කරමින්, පහත සඳහන් දෑ **ගණනය කරන්න**:

(a) මූලික මිල යටතේ දළ එකතු කළ අගය [Gross Value Added (GVA)]. (ලකුණු 05)

(b) වෙළෙඳපොළ මිලට දළ දේශීය නිෂ්පාදිතය [Gross Domestic Product (GDP)]. (ලකුණු 02)

(c) වෙළෙඳපොළ මිලට දළ ජාතික ආදායම [Gross National Income (GNI)]. (ලකුණු 02)

©JMC vLearning

# පසුගිය විභාග ප්‍රශ්න

(C) ආර්ථික ක්‍රියාවලියට දායකත්වය දෙනු ලබන සාර්ව ආර්ථිකයේ ප්‍රධාන අංශ තුනක්(03) **හඳුනා දක්වන්න**.
(ලකුණු 03)

(D) "සංකෝචනාත්මක පිස්කල් (රාජ්‍ය මූල්‍ය) ප්‍රතිපත්තිය (Contractionary Fiscal Policy)" සහ "ප්‍රසාරණාත්මක පිස්කල් (රාජ්‍ය මූල්‍ය) ප්‍රතිපත්තිය (Expansionary Fiscal Policy)" අතර වෙනස **පැහැදිලි කරන්න**. (ලකුණු 04)
(මුළු ලකුණු 20)

(A) ව්‍යාපාර චක්‍රයේ (business cycle) විවිධ අවධීන් (phases) **පැහැදිලි කරන්න**. (ලකුණු 04)

©JMC vLearning
JMC vLearning "your virtual learning partner"